


CED Sri Lanka
Quality Education For All
අධ්‍යාපන සංවර්ධන සන්ධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව කලාපය 2025 පෙබරවාරි



ඡායාරූපය අන්තර්ජාලයෙනි

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය මිලියන 22.97 ක් වන අතර එහි පුරුෂ අනුපාතය 48.3% ක් ද, ස්ත්‍රී අනුපාතය 51.6% ද වේ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2023). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමයේ විකාශනයත් සමග මානවයාගේ ජීවන තත්ත්වය වඩාත් ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි වූ අතර එය සමාජ, ආර්ථික,දේශපාලනික හා තාක්ෂණික වර්ධනය සඳහා හේතු විය. නමුත් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී හඳුනාගත හැකි කරුණ වන්නේ ප්‍රාදේශීය වශයෙන් යම් යම් ආකාරයේ සමාජයීය, සංස්කෘතික, ආර්ථික හා දේශපාලන වශයෙන් විෂමතාවන් පැවතීම නිසා අධ්‍යාපනය ලබා ගැනීම හා ප්‍රවේශවීම සඳහා විවිධ බාධාවන් පවතින බවයි. එබැවින් අධ්‍යාපනයේ අරමුණු නිසි පරිදි ලඟා කර ගැනීමට නොහැකි වීම කනගාටුවට කරුණකි. අධ්‍යාපනය ලබා ගැනීම හෝ අධ්‍යාපන ප්‍රවේශකත්වය සම්බන්ධයෙන් තවමත් පවතින්නේ ගෝලීය සංවර්ධන අභියෝගයක් වශයෙනි. එබැවින් මෙම ලිපිය තුලින් අවධානය යොමු කර ඇත්තේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා ස්ත්‍රී-පුරුෂ බාවය පිළිබඳ පුළුල් විවරණයකි.

**අධ්‍යාපන විකාශනය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය**

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධයෙන් ඓතිහාසික විකාශනය කෙරෙහි අවධානය යොමු කරන විට ඒ සම්බන්ධයෙන් වූ, කාන්තා අධ්‍යාපනයේ සන්ධිස්ථාන මෙන්ම සාම්ප්‍රදායික ස්ත්‍රී-පුරුෂ

3 වන පිටුවට

## ඇතුළත

ශ්‍රී ලංකාව පිළිබඳ මූලික දත්ත හා රජයේ පාසල් පිළිබඳ මූලික තොරතුරු → 2
ශ්‍රී ලංකාවේ වැඩිහිටි අධ්‍යාපනය සංකල්පය භාවිතාවන් සහ අපේක්ෂාවන් → 7-9
හඬට හඬක් - අධ්‍යාපනය වරප්‍රසාදයක් නොව අයිතියකි → 9-11
Finance-Budget and Budget monitoring → 12-14
CED නායකත්වයෙන් අධ්‍යාපන අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් එක් පියවරක් → 15
අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අනුග්‍රහයෙන් දීපව්‍යාප්තව පවත්වන ලද ලෝක ළමා දින වැඩසටහන් → 16

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්ත්වයන් නොසළකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා

දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

**අපගේ අරමුණු**

1. සැමට ගුණාත්මක හා සම අධ්‍යාපනයකට අවස්ථාවන් සළසන ජාතික හා පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තීන් සිවිල් සමාජ සංවිධානයන්ගේ දායකත්වය ගෙන ඒමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් කිරීම සහ එය ප්‍රවර්ධනය කිරීම.
2. හැකි උපරිම මට්ටමින් ජාතික අවශ්‍යතාවන් සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන අයුරින් අධ්‍යාපනය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, ප්‍රතිසංස්කරණ සහ සැළසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට බලපෑම් හා පෙළඹ වීම් කිරීම.
3. කිසිවෙකුත් මඟ නොහැරෙන ආකාරයෙන් සහ සියලු පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අන්තර්ගත වන පරිදි අධ්‍යාපන සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිණිස සියලුම මට්ටම්වල සිවිල් සංවිධාන කණ්ඩායම්වල සහ ජාලයන්ගේ කුසලතාවන් ශක්තිමත් කිරිම.
4. ගුණාත්මක සහ සාධාරණ අධ්‍යාපනයක් සහතික කිරීම උදෙසා අධ්‍යාපන ප්‍රතිපත්ති, සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නිරීක්ෂණය කිරීම සහ නිර්දේශයන් සිදු කිරීම.

## ශ්‍රී ලංකාව පිළිබඳ මුලික දත්ත හා රජයේ පාසල් පිළිබඳ මුලික තොරතුරු

| Country Fact and Figures | |
|---|---|
| Mid-year population ('000) (2023) | 22,037 |
| Population density (2023) persons per sq.km. | 351 |
| Gini coefficient of household income (2019) | 0.46 |
| HDI (Value/Rank): Rank among 193 countries | 0.780 – 78 |
| Primary net enrolment ratio | 85.1% |
| Age specific enrolment ratio (grade 1-9) | 90.6% |
| Age specific enrolment ratio (age 18-22 yrs): Only includes internal enrolment of university students | 9.9% |
| From A/L eligible for university admission | 63.3% |

Sources: Annual Census Bank Report 2023

| Basic Statistic of the Government School - 2023 | |
|---|---|
| All Government Schools | 10,096 |
| National Schools | 396 |
| Provincial Schools | 9700 |
| All Teachers | 237,787 |
| Male Teachers | 56,570 |
| Female Teachers | 181,217 |
| Education Zones | 100 |
| Education Divisions | 312 |

Sources: Annual School Census Report 2023 – Ministry of Education

**සංස්කාරක සටහන**

මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණුවල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන් ම අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සළකන්න.


අධ්‍යාපන සංවර්ධන සන්ධානය

නො. 17, ධර්මපාල මාවත,

රාජගිරිය.

**හඩ සඟරාව උපදේශක මණ්ඩලය**

කේ. ඩී. පීරිස් මහතා, වජිර උමගලිය මහතා, මහින්ද සිල්වා මහතා, එම්. ඒ. ජේ. රියාස් මහතා, එස්. පී. මෝහන් මහතා


EDUCATION OUTLOUD advocacy & social accountability

GPE Transforming Education

CED Sri Lanka අධ්‍යාපන සංවර්ධන සන්ධානය

**1 වන පිටුවෙන්**

භූමිකාව හා එය අධ්‍යාපනයට සිදු කළ බලපෑම පිළිබඳ අවධානය යොමු කල හැකිය. මෙම ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධයෙන් යොන්ග් දක්වන්නේ පහත ආකාරයටයි.

" …. Our basic social identities as men and as women are socially constructed rather than based on fixed biological characteristics. In this sense we can talk about the historical differences in masculinity (femininity) in a given society, as well as the differences in them between societies" (Young, 1988).

එහිදී ජීව විද්‍යාත්මක වෙනස්වීම මත කාන්තා පුරුෂ දෙපාර්ශවයට සමාජයීය හා සංස්කෘතික වශයෙන් හිමිවන භූමිකාව මත ඔවුන්ගේ අනන්‍යතාව හා වගකීම් බැඳී පවතී. කාන්තාවක් වීම තුල, ඇයට හිමිවන වගකීම් හා භූමිකාවන් අතර කුඩා කාලයේ සිටම දියණිය, සහෝදරිය, බිරිඳ, මව යනාදී වශයෙන් ද, පුරුෂයෙක් වීම තුල ඔහුට හිමිවන වගකීම් හා භූමිකාවන් අතර කුඩා කල සිටම පුතා , සහෝදරයා, ස්වාමි පුරුෂයා , පියා යනාදී වශයෙන් කුටුම්බමය, සමාජයීය, සංස්කෘතික හා දේශපාලනමය වශයෙන් හිමිවේ. මෙම තත්වයන් තුල අතීතයේදී සාම්ප්‍රදායික සමාජයීය අදහස් හා ආකල්ප අනූන පුරුෂ මූලික සමාජ ක්‍රමයක් ශ්‍රී ලංකාව තුල පැවතිනි. මුල් කාලයේ පැවති අවශ්‍යතා සීමිත වීම හා ක්‍රම ක්‍රමයෙන් එම අවශ්‍යතා අසීමිත වීමත් සමග අධ්‍යාපන අයිතිය ලබා ගැනීම වෙනුවෙන් ක්‍රියා කර තිබේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පරිණාමය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී 06 වන සියවසේදී පමණ මහාවංශය, දීපවංශය වැනි ඓතිහාසික මූලාශ්‍රයන් පරිශීලනය සමඟ ගිහි, පැවිදි සියලුදෙනා ආරාම, පන්සල් කේන්ද්‍රගත වූ අධ්‍යාපන ක්‍රමයක් මත අධ්‍යාපනය ලබා ගන්නා ලදී. යටත්විජිත සමයට පෙර අවධියේදී සීමිත ප්‍රභූ පැලැන්තියට හා ආගමික නායකයන්ට පමණක් අධ්‍යාපන ප්‍රවේශකත්වය වූ අතර කාන්තාවන්ට හිමිනොවීය. 16 වන සියවසේදී පෘතුග්‍රීසි ආක්‍රමණයන්ට ශ්‍රී ලංකාව මුහුණදීමත් සමඟ රෝමානු කතෝලික පල්ලි හරහා ආගම ව්‍යාප්ත කිරීමේ අරමුණින් ක්‍රිස්තියානි ප්‍රාථමික පාසල් ක්‍රමය හා ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදුනි. 1936 දී බ්‍රිතාන්‍ය පාලන ක්‍රමය යටතේ රාජ්‍ය අරමුදල් සහිත පාසල් පද්ධතියක් ආරම්භ විය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ ස්වර්ණමය යුගයක් ලෙස බොහෝ දෙනා 1931-1934 කාලය හඳුන්වන්නේ අධ්‍යාපන අමාත්‍ය ධූරය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර විසින් හෙබවූ නිසාය. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ නායකත්වය සමඟ ආරම්භ වූ පාසල් පද්ධති ක්‍රමය වර්තමානය දක්වාම පවතින අතර 1935 දී ප්‍රථම ද්විතියික පාසල ලෙස කොළඹ රෝයල් පාසල ආරම්භ විය. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අර්ධ වශයෙන් බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස් ලබා ගැනීමත් සමඟ ජාති, ආගම්, කුල භේදයකින් තොරව සැමට සමාන අධ්‍යාපන ප්‍රවේශකත්වයක් ලබා දීම අරමුණ විය. එ අනුව 1947 වසරේදී නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය හඳුන්වාදීම සිදුවිය. 1953 වසරේදී සිංහල හා දෙමළ මාධ්‍යයන්ගෙන් ද්විතියික අධ්‍යාපනය ආරම්භ වීම, 1972 වසරේදී විශ්වවිද්‍යාල පද්ධතියේ ආරම්භය (කොළඹ හා පේරාදෙණිය විශ්ව විද්‍යාල බිහිවීම) සිදුවීම යන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මෙන්ම එදා සිට අද දක්වා වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් ශ්‍රී ලංකාවේ හැරවුම් ලක්ෂයන් බවට පත්විය. එසේ පරිණාමය වූ අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලයක් ලෙස වර්තමානය වනවිට සැමට ගුණාත්මක, ඵලදායී හා අර්ථාන්විත අධ්‍යාපනයක් ලබා දීම අරමුණ වී තිබේ. ඒ අනුව 1940 ට පෙර පැවති කාලය තුල කාන්තාවන්ට අධ්‍යාපන ප්‍රවේශකත්වය පිළිබඳ පැවතියේ ඉතාමත් අවම තත්ත්වයකි. නමුත් නිදහස් අධ්‍යාපනය ලැබීමත් සමග සියලු දෙනා ඇතුලත් වූ අධ්‍යාපන ක්‍රමයක් හිමිවිය. එය ශ්‍රී ලංකාවේ සංවර්ධනය සම්බන්ධයෙන් හැරවුම් ලක්ෂයක් විය.

වර්තමානය වන විට ශ්‍රී ලංකා සමාජය තුල ස්ත්‍රීන්ට, යම් ආකාරයකට සාම්ප්‍රදායික කාන්තා භූමිකාවකට එහා ගිය සමාජානුයෝගී, ආර්ථික කටයුතුවල නියැලෙන, දේශපාලන වශයෙන් සක්‍රීය, නිදහස් සිවිල් පුරවැසියන් ලෙස ක්‍රියාකරන ආකාරය හඳුනාගත හැකිය. ඒ සඳහා සමාජ පරිසරය, නීතිය හා සාමය හා අධ්‍යාපනය තුලින් ප්‍රබල පිටිවහලක් වනු ඇත.කෙසේ නමුත් යම් යම් ආගම්, සමාජ දර්ශන, ආකල්ප මත එම තත්ත්වය වෙනස්විය හැකිය. එවැනි ශක්තිමත් වටපිටාවක් ගොඩ නැගීමෙහිලා එහි අඩිතාලම සපයන්නේ අධ්‍යාපන ක්‍රමය මගිනි. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට ශ්‍රී ලංකාවේ ස්ත්‍රී, පුරුෂ සාක්ෂරතා අනුපාතය ඉහළ මට්ටමක පවතින බව නොරහසකි. 2022 වර්ෂයේ ශ්‍රී ලංකාවේ සාක්ෂරතා අනුපාතය 93.3% ක් වේ. එහි පුරුෂ සාක්ෂරතා අනුපාතය 94.3% ක් වන අතර ස්ත්‍රී සාක්ෂරතා අනුපාතය 92.3% කි (මහා බැංකු වාර්තා, 2022). අධ්‍යාපනයට යොමුවීමේ සමස්ත ප්‍රමාණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී, ඉහල අනුපාතයක් හඳුනාගත හැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රාථමික, ද්විතියික හා විශේෂ අධ්‍යාපනය සඳහා ලියාපදිංචි වන ප්‍රමාණය කෙරෙහි අවධානය යොමු කරන විට, පාසල් යන පිරිමි ළමුන්ගේ අනුපාතිකය (Male Students of school enrolment rate) 49.7% ක් හා පාසල් යන ගැහැණු ළමුන්ගේ අනුපාතිකය (Female Students of school enrolment rate) 50.3% ක් වශයෙන් හඳුනාගත හැකිය (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020). උසස් අධ්‍යාපනය සඳහා ද ස්ත්‍රී පුරුෂ සියලු දෙනාට ඉහළ ප්‍රවේශකත්වයක් පවතී. ඊට අමතරව කලා, වාණිජ විෂය ධාරාවන් අධ්‍යයනය සඳහා ගැහැණු ළමුන් වැඩි වශයෙන් යොමු වී පවතින අතර ගණිත, විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවන් හැදෑරීමට යොමු වන්නේ ඉතා සීමිත ප්‍රමාණයකි (වගු අංක 01). නමුත් බහුතර පිරිමි ශිෂ්‍යයන් ප්‍රමාණයක් ගණිත, විද්‍යා හා තාක්ෂණ විෂය ධාරාවන් හැදෑරීමට ප්‍රමුඛතාවයක් දක්වනු ඇත.

**ව.අ 01 : රජයේ පාසැල්හි උසස් පෙළ විෂය ධාරාවන් හැදෑරීම (ස්ත්‍රී - පුරුෂ අනුව)**

| Category | Total Students | % | Male | % | Female | % |
|---|---|---|---|---|---|---|
| Students by A/L Stream | | | | | | |
| **Bio Science** | 50,718 | 11.9 | 13,979 | 27.6 | 36,739 | 72.4 |
| **Physical Science** | 47,833 | 11.2 | 29,516 | 61.7 | 18,317 | 38.3 |
| **Arts** | 172,415 | 40.4 | 56,056 | 32.5 | 116,359 | 67.5 |
| **Commerce** | 88,184 | 20.7 | 40,574 | 46.0 | 47,610 | 54.0 |
| **Technology** | 48,194 | 11.3 | 35,919 | 74.5 | 12,275 | 25.5 |
| **Other*** | 13,233 | 3.1 | 8,541 | 64.5 | 4,692 | 35.5 |
| Remarks: Other* - Included Common stream and vocational stream (13 years program) | | | | | | |

මූලාශ්‍රය : පාසල් සංගණන සංඛ්‍යාලේඛන, 2022

එසේම විශ්වවිද්‍යාල, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතනයන්හි ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවටටම ඔවුන්ගේ හැකියාව මත අධ්‍යාපනය ලැබීමේ අවකාශය සමසේ විවෘතව පවතී. ඊට අමතරව විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා ද, අධ්‍යාපනය ලැබීමේ අවකාශය ලබා දීමට මේ වන විට ක්‍රියාකර තිබෙන බවත් පෙන්වා දිය හැකිය. එපමණක් නොව, නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුලද, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම අධ්‍යාපනය ලැබීම සඳහා ප්‍රවේශවීමේ අවස්තාව සලසා දී තිබේ. අධ්‍යාපනය, සමස්ත ප්‍රජාවේම සංවර්ධනය සඳහා රුකුලක් වන බව පෙන්වා දිය හැකිය. එය අස්ලාම් මෙසේ දක්වයි. If Education has an empowering effect on women in terms of Social cultural, economic, interpersonal, legal, political and psychological domains, investing in education is worthwhile not only from an individual but also from a national perspective (Aslam, 2013).

### අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට පවතින බාධාවන්


කෙසේ නමුත් ශ්‍රී ලංකාවේ සමාජ, සංස්කෘතික, ආර්ථික හා භූගෝලීය තත්ත්වය මත අධ්‍යාපනයට ප්‍රවේශවීමේ හෝ අධ්‍යාපනය ලැබීම සම්බන්ධයෙන් යම් යම් ආකාරයේ අභියෝගාත්මක තත්ත්වයක් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාව පීතෘ මූලික සමාජ ක්‍රමයක් සහිත සංවර්ධනය වෙමින් පවතින රටක් වන අතර සංස්කෘතික සම්මතයන් සමාජ අපේක්ෂාවන් මත සමාජ ක්‍රමය විසින් ගොඩනගා ගත් ගතානුගතික ආකල්ප හා මතිමතාන්තර මුල්බැසගෙන තිබෙන ආකාරය හඳුනාගත හැකිය. ඒ අනුව, සමාජය විසින් ඔහු හෝ ඇය, පුරුෂයෙක් වීම හෝ කාන්තාවක් වීම හේතුවෙන් ඔවුනට හිමි භූමිකාවන්, වගකීම්, චරිත ලක්ෂණ, ඇදුම් පැළඳුම් යනාදියේ වෙනස්වූ සමාජ සම්මතයන් සමාජගත වී තිබෙන බව හඳුනාගත හැකිය."...A mother might fuss over a baby girl's hair, dress and hair, dress and tell her how pretty she is in a simpering tone. Boys might be spoken to in a more matter of the fact tone with the use of a gruff voice. Girls dressed in frilly dress, boys encouraged to be independent "(Bhasin,2000). සමාජයීය වශයෙන් ගැහැණු දරුවකු කුඩා කල සියුමැලි, ලදබොළඳ ලක්ෂණවලින් යුක්ත අතර, ඇයට බෝනික්කන් හා මල් බඳුන් ලබාදීම ද, පාසල තුලදී පන්ති කාමරය අතුගා දැමීම වැනි කාර්යයන් ද, බිරිඳක් වශයෙන් දරුවන් හදාවඩා ගැනීම යන කාර්යයන් ඇයට සමාජය විසින් ඉදිරිපත් කර ඇත. පිරිමි ළමයෙක් කුඩා කල සිටම, මෝටර්රථ ආදිය සමග සෙල්ලම් කිරීමට දිරිමත් කරන අතර පාසලේදී පන්තිකාමර සැකසීම වැනි කාර්යයන් සිදු කිරීමටත්, ස්වාමි පුරුෂයෙකු ලෙස පවුලේ ආර්ථිකය උපයන්නා ලෙසද, තීරණ ගන්නකු ලෙස ද, කටයුතු කරයි. ආර්ථික අභියෝගයන් කෙරෙහි අවධානය යොමු කරන විට, රටක් වශයෙන් මුහුණදෙන සමස්ත ආර්ථික අභියෝග යන් මෙන්ම කුටුම්බ වශයෙන් ජීවත් වීමේදී ඔවුන්ට මුහුණ දීමට සිදුවන ආර්ථික ගැටලු, අධ්‍යාපන ප්‍රවේශකත්වය සඳහා බලපායි. මෙහිදී ග්‍රාමීය අංශය තුළ දරිද්‍රතාව, ක්ෂුද්‍ර ආර්ථික මට්ටම්, පසුගාමී යටිතල පහසුකම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය ලබාගැනීම්, ළමා විවාහ යනාදී සමාජ ආර්ථික ගැටලු හේතුවෙන් අධ්‍යාපන ප්‍රවේශකත්වය සම්බන්ධයෙන් වර්තමානය වන විට ගැටලු මතු වී තිබේ. එසේම කොවිඩ් වසංගතයෙන් පසුව ඇති වූ ආර්ථික අර්බුධයෙන් විශාල වශයෙන් අධ්‍යාපනික ලිපිද්‍රව්‍ය හා උපකරණ මිල ඉහළ යාමත් හේතුවෙන් විශාල වශයෙන් මහජනතාව පීඩාවට පත් ව ඇත. ඊට අමතරව කලාපීය වශයෙන් ගත්කල භූ දේශපාලන අවකාශීය විෂමතාවයන් හේතුවෙන් සංවර්ධනය විෂම ලෙස ව්‍යාප්ත වී තිබේ. එබැවින් අධ්‍යාපන ප්‍රවේශකත්වය සම්බන්ධයෙන් ගැටලු පවතී.

### අධ්‍යාපනය හා කාන්තා නායකත්වය

ජාතික මට්ටමෙන් ශ්‍රී ලංකා රජය හා අධ්‍යාපන අමාත්‍යංශය එක්ව සියලු දෙනාටම සමානව ප්‍රවේශ විය හැකි අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම වෙනුවෙන් උපායමාර්ගික සැලසුම් ගෙන තිබෙන නමුත් ප්‍රාදේශීය වශයෙන් ඉහත කී ආකාරයට සමාජ, ආර්ථික, පාරිසරික අභියෝගයන්ට ප්‍රජාව මුහුණ දෙයි. ඒ අනුව ජාතික මට්ටමින් සලකා බලන් කල, ශ්‍රී ලංකාවේ පවතින සියලුම රජයේ පාසල් ගණන 10,096 ක් වන අතර ඉන් පිරිමි පාසල් ගණන 146 ක් ද, කාන්තා පාසල් ගණන 240 ක් ද, මිශ්‍ර පාසල් ගණන 9710 ක් ද වේ. ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සංඛ්‍යාව 237,787 ක් වන අතර ඉන් 76.2% ගුරුවරියන් ද 23.7% ගුරුවරුන් ද වේ (අධ්‍යාපන අමාත්‍යංශය, 2023). ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රවේශය සම්බන්ධයෙන් අවධානය යොමු කරන විට 2021 අධ්‍යන වර්ෂයට අදාලව උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වී ඇති මුළු උපාධි අපේක්ෂකයන් ගණන 152,616 වන අතර ඉන් 35.9% පුරුෂ උපාධි අපේක්ෂකයන් ද, 64.1% කාන්තා උපාධි අපේක්ෂිකාවන් ද වේ (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2022). ශ්‍රී ලංකා සමාජය තුල අධ්‍යාපනික වශයෙන් ඉහල ස්ථර හොබවන කාන්තා නායකත්වය දේශපාලනික වශයෙන් ද, ආර්ථික වශයෙන් ද, හඳුනාගත හැකිය. ඒ අනුව, ශ්‍රී ලංකා දේශපාලනය තුල ප්‍රබල නායකත්වයක් දරන, ගරු. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය (ලොව පළමු කාන්තා අගමැතිනිය - 1960), ගරු. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණිය (ශ්‍රී ලංකාවේ පස්වන ජනාධිපතිනිය), ගරු. ශ්‍රිරානි බණ්ඩාරනායක මහත්මිය (ශ්‍රී ලංකාවේ පළමු කාන්තා ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු), අනූෂා සිරිරත්න මහත්මිය (ශ්‍රී ලංකාවේ පළමු ගුවන් නියමුවරිය) මෙන්ම වර්තමානයේ ගරු. හරිනි අමරසූරිය මැතිණිය (ශ්‍රී ලංකාවේ 17 වන අගමැතිණිය) යනාදී කාන්තා නායකත්වය රටට විශාල කීර්තියක් මෙන්ම ප්‍රබල නායකත්වයක් සඳහා පිටිවහලක් සපයනු ඇත. 2020 වසරේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නවවැනි පාර්ලිමේන්තු මැතිවරණයේ කාන්තා නියෝජනය 5.3% කි. වත්මන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දසවැනි පාර්ලිමේන්තු මැතිවරණයේ පාර්ලිමේන්තු ආසන 22 ක් කාන්තාවන් සඳහා ලබා දී තිබෙන අතර එය සුවිශේෂී සන්ධිස්ථානයක් වනු ඇත (The Parliament of Sri Lanka). එපමණක් නොව ආර්ථික වශයෙන් ගත්කල ශ්‍රී ලංකාවේ ඉහල ශ්‍රම බලකා සහභාගිත්වයක් හඳුනාගත හැකි අතර එහිදී 2023 වසරට අනුව සමස්ත ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය 48.6% ක් වන අතර පුරුෂ අනුපාතය 68.6% ක් වන ද ස්ත්‍රී අනුපාතය 31.3% ක් වේ. ආර්ථිකය තුළ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය අවම අගයක් ගන්නා අතර විශේෂයෙන්ම පවතින

කලාපීය අසමානතාව හා සංවර්ධනයේ විෂමතාව ඒ සඳහා හේතු වී ඇත. එහිදී, නාගරික ප්‍රදේශවල සේවා හා කර්මාන්ත අංශයේ ඉහළ කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වයක් හඳුනාගත හැකි අතර ග්‍රාමීය ප්‍රදේශවල වතු අංශයේ ඉහළ කාන්තා සහභාගිත්වයක් හඳුනාගත හැකිය.

වගු අංකය 01 : ස්ත්‍රී පුරුෂ භාවය සහ අධ්‍යාපන මට්ටම අනුව ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය – 2023




මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2023

## අධ්‍යාපනය හා ගෝලීය ප්‍රයත්නයන්

අධ්‍යාපනය සම්බන්ධයෙන් ජාතික වශයෙන් ක්‍රියාත්මක වන ආයතන අතර අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, තිරසාර සංවර්ධන කවුන්සලය ආදී රාජ්‍ය ආයතන රැසක් ස්ත්‍රී පුරුෂබාවය හා අධ්‍යාපනය නඟා සිටුවීම වෙනුවෙන් විශාල කාර්යභාරයක් සිදුකරයි. අන්තර්ජාතික වශයෙන් සියලු දෙනාටම ප්‍රවේශ විය හැකි අධ්‍යාපන තත්ත්වයක් ඇති කරලීම උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් අතර 2000 වසරේදී ක්‍රියාත්මක වූ සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථහි සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම (MDG 2: Achieve universal primary education) යථාර්ථයක් කිරීමට හැකිවිය. දකුණු ආසියානු කලාපයේ රටවල්හි ප්‍රාථමික අධ්‍යාපනය ලබන ළමයින්ගේ සංඛ්‍යාව ප්‍රමාණාත්මකව සැලකීමේදී 1990 වසරේදී පිරිමි ළමුන් ගණන 100 ක් වූ අතර ගැහැණු ළමයින් ගණන 74 ක් විය. එය 2015 වන විට පිරිමි ළමුන් ගණන 100 ක් වන අතර ගැහැණු ළමුන් ගණන 103 ක් දක්වා ඉහළ ගොස් තිබිණි. ඒ අනුව සැලකීමේදී සහශ්‍ර සංවර්ධන අභිමතාර්ථ අරමුණු කලාපයක් වශයෙන් අප 2015 වන විට ලබා ගැනීමට අපට හැකිවීම ජයග්‍රහණයකි. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය සහතික කිරීම සහ කාන්තා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා රජය කැපවී සිටින බැවිනි. 1947 දී රජය විසින් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සියලු දරුවන් සඳහා නොමිලේ ප්‍රාථමික, ද්විතීයික සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය හඳුන්වා දෙන ලදී.

ඊට අමතරව 2015 - 2030 දක්වා ක්‍රියාත්මක වන තිරසාර සංවර්ධන අරමුණු අංක 04 ට අනුව, සියලු දෙනාටම සමානාත්මතාවයෙන් යුත් ගුණාත්මක වශයෙන් ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් හා අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා ලබාදීම තහවුරු කිරීම (SDG 04 - Ensure inclusive and equitable quality education and promote lifelong learning opportunities for all) අරමුණු කර ගෙන තිබෙන අතර අරමුණු අංක 05 ට අනුව, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සහ සියලු කාන්තාවන් හා ගැහැණු ළමයින් සවිබල ගැන්වීම (SDG 05 - Achieve gender equality and empower all women and girls) වෙනුවෙන් ක්‍රියාත්මක වෙයි.

**Achieve gender equality and empower all women and girls**

5.1 End all forms of discrimination against all women and girls everywhere

5.2 Eliminate all forms of violence against all women and girls in the public and private spheres, including trafficking and sexual and other types of exploitation

5.3 Eliminate all harmful practices, such as child, early and forced marriage and female genital mutilation

5.4 Recognize and value unpaid care and domestic work through the provision of public services, infrastructure and social protection policies and the promotion of shared responsibility within the household and the family as nationally appropriate

5.5 Ensure women's full and effective participation and equal opportunities for leadership at all levels of decision making in political, economic and public life

5.6 Ensure universal access to sexual and reproductive health and reproductive rights as agreed in accordance with the Programme of Action of the International Conference on Population and Development and the Beijing Platform for Action and the outcome documents of their review conferences

5.A Undertake reforms to give women equal rights to economic resources, as well as access to ownership and control over land and other forms of property, financial services, inheritance and natural resources, in accordance with national laws

5.B Enhance the use of enabling technology, in particular information and communications technology, to promote the empowerment of women

5.C Adopt and strengthen sound policies and enforceable legislation for the promotion of gender equality and the empowerment of all women and girls at all levels

මූලාශ්‍රය : https://www.statistics.gov.lk/sdg/index.php/sdg

ඒ අනුව ස්ත්‍රී පුරුෂ සවිබල ගැන්වීම හරහා සියලු දෙනා ඇතුළත් ගුණාත්මක අධ්‍යාපනයක් ඇති කිරීම වෙනුවෙන් තිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක වී තිබෙන ආකාරය හඳුනාගත හැකිය.

කාන්තාව අරමුණු කරගත් ඉලක්ක රැසක් තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් තුළ හඳුනාගත හැකි අතර විශේෂයෙන්ම කොවිඩ් 19 වසංගත තත්ත්වය හා ආර්ථික අර්බුධ තත්ත්වය නිසා විවිධ අභියෝගයන්ට මුහුණ දී තිබෙන ආකාරය හඳුනාගත හැකිය. විශේෂයෙන්ම පහළ සනීපාරක්ෂක පහසුකම්, දේශගුණික විපර්යාසවල බලපෑම, කාන්තා ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රී පුරුෂ අසමානතාව යනාදීන්ට එරෙහිව හා කාන්තා සවිබලකරණය සම්බන්ධයෙන් විවිධ ජාතික හා ජාත්‍යන්තර සංවිධාන ක්‍රියාත්මක වී තිබෙන ආකාරය වර්තමානය වන විට හඳුනාගත හැකිය. ඒ

හේතුවෙන් තිරසාර සංවර්ධන ඉලක්ක 17 පුරාවටම කාන්තා සවිබලකරණය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබෙන ආකාරය හදුනාගත හැකිය. ඊට අමතරව, ඔහ උදපැබ නම් ජාත්‍යන්තර සංවිධානය 2014 වසරේ සිට ශ්‍රී ලංකාවේ කාන්තා සවිබලකරණය වෙනුවෙන් ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා රජය හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ එක්ව කාන්තා අයිතිවාසිකම් ඉහළ නැංවීම වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය පර්යේෂණ හා උද්දේශන සිදුකිරීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගනිමින් පහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පෙන්වා දිය හැකිය.

- කාන්තාවන්ගේ ආර්ථික සවිබලකරණය ඇති කිරීම (Women's economic empowerment)
- රාජ්‍ය පාලනය සහ තීරණ ගැනීමේ දී කාන්තා නායකත්වය (Women's leadership in governance and decision-making)
- කාන්තා, සාමය සහ ආරක්ෂාව (Women, Peace and Security)
- කාන්තා හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය වැළැක්වීම (Preventing violence against women and girls)

යථෝක්ත කරුණු අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හා ස්ත්‍රී පුරුෂ බාවය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී අනෙකුත් දකුණු ආසියානු රටවල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශයේම අධ්‍යාපනය සදහා ඉහළ ප්‍රවේශකත්වයක් පැවතීම ධනාත්මක ප්‍රවණතාවයකි. වර්තමානය වන විට අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ අධ්‍යාපනය පිළිබද පවතින විශ්වාසය අඩුකම, උසස් අධ්‍යාපන විෂයයන් සදහා පවතින මානව සම්පත් හිහකම, භෞතික සම්පත් හිගකම, පාසලෙන් අද හැලෙන ළමයින් සංඛ්‍යාව ඉහළ වීම,

වත්මන් විෂයමාලා අදාළත්වය හා යෝග්‍යතාව යනාදී ගැටළු වර්තමානයේ හදුනාගත හැකිය. මීට අමතරව ගෘහාශ්‍රිතව, වැඩ ස්ථානයේදී හා ලිංගිකව සිදුවන ප්‍රචණ්ඩ ක්‍රියා පිටුදැකීම සදහාත් කාන්තාවන්ට සුරක්ෂිත වටපිටාවක් ඇති කිරීම සදහාත් අධ්‍යාපනය තුලින් විනයවත් ප්‍රජාවක් ඇති කිරීම සදහා අවධානය යොමු විය යුතුය. එසේම අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවරට අනුකූල වන පරිදි හා සියලුදෙනාටම සමානාත්මතාවයෙන් යුත් ඉහළ ගුණාත්මක අධ්‍යාපනයක් සහ අඛණ්ඩ ඉගෙනුම් අවස්ථා ලබාදීම තහවුරු කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වීම අනාගත පරපුරේ අභිවෘද්ධිය සදහා බලපානු ඇත. එමෙන්ම ජාතික හා ජාත්‍යන්තර අරමුණු ළඟා කර ගැනීම වෙනුවෙන් වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ පවතින යම් යම් අඩුපාඩු ඩිජිටල් ලෝකයකට යෝග්‍ය පරිදි සංශෝධනය කර ගනිමින් වඩා හොද අධ්‍යාපන ක්‍රමයක් ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීම වෙනුවෙන් කටයුතු කිරීම අප සියලු දෙනාගේම වගකීමයි.

**කේ. ඒ. රංගනී ලක්මාලි**
**අධ්‍යාපන සංවර්ධන සන්ධානය**

# ඔබ දන්නවාද?



- සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ප්‍රථමික අධ්‍යාපනය සදහා ඇතුලත් වීම **91%** ක් දක්වා ලගා වී තිබේ.
- තවමත් ප්‍රාථමික අධ්‍යාපනය හැදෑරිය යුතු වයසේ දරුවන්ගෙන් **මිලියන 57** ක් බැහැරව සිටින අතර ඉන් අඩකට වැඩි පිරිසක් ජිවත් වන්නේ උප සහරා අප්‍රිකාවේ ය.
- ප්‍රාථමික අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් **50% කට වැඩි පිරිසක්** ජිවත් වන්නේ ගැටුම්වලින් යුත් ප්‍රදේශවලය.
- සංවර්ධනය වෙමින් පවතින රටවල **ගැහැණු ළමුන් 04 දෙනෙකුගෙන් එක් ළමයෙකු** පාසල් අධ්‍යාපනය නොලබති.
- ලොවපුරා මිලියන 103කට මුලික සාක්ෂරතා කුසලතාව නොමැති අතර ඉන් **60%** ක් කාන්තාවන් වේ.
- ළමුන් හා නව යොවුන් වියේ දරුවන් **10 දෙනෙකුගෙන් 06 දෙනෙකුට** කියවීම හා ගණිතය පිළිබද පවතින්නේ අවම මට්ටමේ දැනුමකි

(Sources: undp.org)

# ශ්‍රී ලංකාවේ වැඩිහිටි අධ්‍යාපනය සංකල්පය භාවිතාවන් සහ අපේක්ෂාවන්



සියලුම ළමුන්ට නොමිළයේ අධ්‍යාපනය ලබාදීමට ශ්‍රී ලංකාවේ රජය විසින් 1947 වසරේදී ගත් ප්‍රතිපත්තිමය තීරණය සහ ඉන් අනතුරුව, බලයට පත්වූ රජයන් විසින් අධ්‍යාපනයේ වැඩිදියුණුව වෙනුවෙන් ලබාදුන් විශිෂ්ඨ සහයෝගය ද හේතු කොටගෙන විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව විශිෂ්ඨ කාර්ය සාධනයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී ඇත. ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනයට ප්‍රවේශවීමේ ඉහළ අනුපාතිකයත්, ද්විතීයික අධ්‍යාපනය අවසන් කිරීමේ ඉහළ අනුපාතිකයත් පැවැතීම හා ස්ත්‍රී, පුරුෂ දෙපාර්ශවයම සම්බන්ධයෙන් සාක්ෂරතා අනුපාතිකය ඉහළ මට්ටමක පැවතීම මේ සඳහා කදිම උදාහරණ වේ. නොමිළයේ අධ්‍යාපනය ලබාදීම ශ්‍රී ලංකාවේ විශාල සමාජ, ආර්ථික පරිවර්තනයකට තුඩුදුන් අතර හොඳ අධ්‍යාපනයක් ලබාගැනීමට මගපෑදීම තුළින් සමාජයේ පහළ ස්ථරයන්හි සිටින පුද්ගලයින්ට ආර්ථික, සමාජයීය සහ දේශපාලනික වශයෙන් ඉහළ ස්ථර කරා ගමන් කිරීමට හැකි වී තිබේ. මෙම තත්ත්වයන් හේතු කොටගෙන ළමුන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදීමට බලවත් තරඟකාරී තත්ත්වයන් ඇතිවී තිබෙන අතර මෙම තත්ත්වය අතිශයින් විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයකට මඟ පාදා ඇත. කෙසේවෙතත් තරුණ රැකියා වියුක්තිය ඉහළයාම අධ්‍යාපන සුදුසුකම්වලට ගැලපෙන රැකියා අවස්ථාවන් නොමැතිවීම සහ ශ්‍රම ඉල්ලීමට අදාළ සුදුසුකම් සහිත ශ්‍රමිකයින් බිහිකිරීමට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අපොහොසත් වීම යන කරුණු මත මෑත කාලීනව අධ්‍යාපනයේ ඵලදායීතාවය පිලිබඳව ගැටලු මතු වී තිබේ. එසේම ස්ත්‍රී, පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය, ප්‍රචණ්ඩත්වය සහ සාමය සහ සංහිඳියාව පිළිබඳ ගැටලු යනාදී සමාජමය ගැටලුකාරී තත්ත්වයන්ට විසඳුම් ලබාදීමට ද විධිමත් අධ්‍යාපන ක්‍රමය අසමත් වී ඇති බව පෙනී යයි.

එසේම කෘත්‍යාත්මක සාක්ෂරතාවය එසේත් නැත්නම් කාර්යබද්ධ සාක්ෂරතාවය එනම් මාධ්‍ය සාක්ෂරතාව, මූල්‍ය සාක්ෂරතාව, පරිගණක සාක්ෂරතාව සහ ජීවන කුසලතා වැනි ක්‍රියාකාරී සාක්ෂරතාව පිළිබඳ දැනුම හා කුසලතා වැඩිහිටියන් අතර අඩු මට්ටමක පවතී. ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ තිරසර සංවර්ධන අරමුණු අංක SDG 04 හි කැපවීම සාක්ෂාත් කර ගැනීම සඳහා, ජීවිත කාලය පුරාම ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය සාධකයකි.

වැඩිහිටි අධ්‍යාපනය යනු කුමක්ද දකුණු ආසියා කළාපයේ ඉහළ සාක්ෂරතාවයන් හිමි රටක් වශයෙන් ශ්‍රී ලංකාවට වැඩිහිටි අධ්‍යාපනය අවශ්‍යද යන්න සම්බන්ධයෙන් විවිධ අදහස් දැක්වීම් තිබේ. සමහර පුද්ගලයින්ගේ මතය වන්නේ, වැඩිහිටි අධ්‍යාපනය අවශ්‍ය වන්නේ විධිමත් අධ්‍යාපන අවස්ථාවන් තුළින් නිසි ප්‍රයෝජනයක් ලබාගැනීමට අපොහොසත් වුණු ජනතාවට බවය. එසේම පාසල් අධ්‍යාපනයෙන් පසුව විශ්ව විද්‍යාල අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය ලබාගැනීමේ වෙනත් විවිධ අවස්ථාවන් පවතින බැවින් සහ රජය මගින් මෙම අවස්ථාවන්ද තහවුරු කර තිබෙන බැවින් වැඩිහිටි අධ්‍යාපනයේ දැඩි අවශ්‍යතාවයක් නොමැති බවය. තවත් අයගේ අදහස වන්නේ, වැඩිහිටි අධ්‍යාපනය යනු, අකුරු කියවීමේ, ලිවීමේ හැකියාවට සීමාවූවක් නොවන බවත් වැඩිහිටියන් වශයෙන් තවදුරටත් ලබාගත යුතු කෞශල්‍යයන් ලබාගැනීමේ අවස්ථාවන් හිමිකර දීමත් බවය.

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන සහ සංස්කෘතික සංවිධානයට අනුව වැඩිහිටි අධ්‍යාපනය සහ ඉගෙනීම (ALE) යනු සාම්ප්‍රදායික පාසල් වයසෙන් ඔබ්බට පුද්ගලයින් විසින්, සාමාන්‍යයෙන් විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් පසු, දැනුම, කුසලතා, ආකල්ප සහ වටිනාකම් ක්‍රමානුකූලව අත්පත් කර ගැනීමයි (UNESCO, Institute for Lifelong Learning,2022). සමාජ, සංස්කෘතික, ආර්ථික සහ පුද්ගලික වර්ධනය සඳහා අවශ්‍ය හැකියාවන්, කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීමෙන්, එය ජීවිත කාලය පුරාම ඉගෙනීම ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරයි. එසේම වැඩිහිටි අධ්‍යාපනය සමානාත්මතාවය සහ අන්තර්කරණය පිළිබඳ අදහස් මත පදනම් වී ඇති බැවින්, එය සමාජීය හා තාක්ෂණික වෙනස්කම් වලට අනුවර්තනය වීමට සහ දවසින් දවස වඩාත් සංකීර්ණ වෙමින් පවතින ලෝකයක සැරිසැරීමට මිනිසුන්ට උපකාරී වේ (UNESCO et al, 2015). වැඩිහිටි ඉගෙන ගන්නන්ගේ බොහෝ අවශ්‍යතා සපුරාලීම සඳහා, සාක්ෂරතා වැඩසටහන්, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය, ජීවන කුසලතා පුහුණුව සහ ජීවිත කාලය පුරාම ඉගෙනීමේ වැඩසටහන් අවශ්‍ය වේ. මෙම ක්‍රියාදාමයන් මගින් තිරසාර සංවර්ධන ඉලක්කය 4 (SDG 4) හි තීරණාත්මක අංගයක් ලෙස වැඩිහිටි අධ්‍යාපනය සමස්ත තිරසර සංවර්ධන අරමුණු ජය ගැනීමට සහාය දක්වයි.

මෙම නිර්වචනයෙන් අර්ථවත් වන කරුණු අප සමාජයට කොතරම්දුරට අදාළ වන්නේද යන්න පිළිබඳව සොයා බැලීමෙන් වැඩිහිටි අධ්‍යාපනයේ අර්ථාන්විත සහ අදාළත්වය පිළිබඳව පැහැදිලි වැටහීමක් ලබාගත හැකිවේ.

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික ගැටළු, එනම් ග්‍රාමීය දරිද්‍රතාවයේ ඉහළ අනුපාත, ඌන සේවා නියුක්තිය සහ මූල්‍ය හා තාක්ෂණ සාක්ෂරතාවය සඳහා සම්පත් සඳහා සීමිත ප්‍රවේශය වැනි කරුණු සැලකිල්ලට ගෙන, වැඩිහිටි අධ්‍යාපන සහ ඉගෙනුම් අවස්ථා ලබාදීම තහවුරු කිරීම විශේෂයෙන් වැදගත් වේ. ජාතියේ වැඩිහිටි

සාක්ෂරතා අනුපාතය 92% ක් වුවද, මාධ්‍ය, මූල්‍ය සහ ඩිජිටල් සාක්ෂරතාවය වැනි ක්‍රියාකාරී සාක්ෂරතාවය දුර්වල මට්ටමක පවතින අතර එය ජීවිත කාලය පුරාම ඉගෙනීමට සහ ආර්ථික කටයුතුවලට බාධා කරයි (ලෝක බැංකුව, 2022).

පසුගිය වසර ගණනාවක් පුරා පැවති ආර්ථික අර්බුදකාරී තත්ත්වයන් හමුවේ විශේෂයෙන් ග්‍රාමීය සහ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදෙමින් සිටී. මෙම තත්ත්වයන් හමුවේ විශේෂයෙන්ම ග්‍රාමීය කාන්තාවන් ණය මුදල් ලබාගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. සුලු පරිමාණ ණය දෙන ආයතන රැසක් අලුතින් බිහිවී ඇති අතර මෙරට ස්ථාපිත පිළිගත හැකි මූල්‍ය ආයතන ද ග්‍රාමීය ණය පහසුකම් සැලසීම සඳහා වෙනම අංශයන් ආරම්භ කර ඇත. කෙසේ නමුත් ලබාගත් ණය මුදල් නැවත පියවීම සම්බන්ධයෙන් ණයකරුවන් බලවත් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණු දී සිටී. ආදායම්, වියදම් කළමනාකරණය කරගැනීමට මූල්‍ය සාක්ෂරතාවය නොමැති වීම, ව්‍යවසායකත්ව හැකියාවන් නොමැතිවීම, වෙළඳපොළ ඉල්ලුම සහ අලෙවිකරණය සම්බන්ධයෙන් පවත්නා අවබෝධය දුර්වල මට්ටමක පැවතීම යනාදී හේතූන් මත මේ ආකාරයෙන් ණය ලබාගත් පිරිස බලවත් පීඩාවට පත් වී සිටිති. මේ සම්බන්යෙන් විසඳුම් ලබාදෙන ලෙස මහජන විරෝධතා සංවිධානය කරන මට්ටමක අදාළ ප්‍රශ්නය ව්‍යාප්ත වී බරපතල වී ඇත. එසේම නොයෙකුත් වංචාකාරී මුදල් ඉපයීමේ මාර්ගවලට යොමුවීම තමන් උපයාගත් ධනය අහිමි කරගත් අවස්ථා රාශියක් වාර්තා වේ. මෙයට අමතරව පරිග ණක සාක්ෂරතාවය, මාධ්‍ය සාක්ෂරතාවය නොමැතිවීම නිසා නොයෙකුත් වංචාවන්ට අසුවීම සහ අපයෝජනයන්ට ලක්වීම සුලභව දක්නට ලැබෙන කරුණක් වී තිබේ.


සහනාධාර සහ අස්වැසුම වැනි සමාජ ආරක්ෂණ ක්‍රමවේදවල පිහිට පතන ජනතාව ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතින අතර සුභසාධන යෝජනා ක්‍රම සඳහා අතිවිශාල පිරිවැයක් දැරීමට සිදු ව තිබේ. සහනාධර මත ජීවත්වන යැපුම් මට්ටමෙන් සිටින තරුණ වැඩිහිටි ජනතාවගේ කුසලතා වර්ධනය කරගනිමින්, ඔවුන් ජාතික ආර්ථිකයට දායකවන ඵලදායී පුරුවැසියන් බවට පත් කිරීමටත්, මානසික සමාජ සෞඛ්‍යයෙන් ඉහළ ස්වාධීන තීරණ ගතහැකි ප්‍රීතිමත් පුරවැසියකු බිහි කිරීම සඳහාත් ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාවන් සහතික කරන වැඩිහිටි ඉගෙනුම් සහ අධ්‍යාපන අවස්ථා ඉතා වැදගත් වන බව පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිවේ.


### ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් සහ ඒවායේ සීමාකාරී සාධක

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත සහ තාක්ෂණික හා වෘත්තීය පුහුණු ප්‍රතිපත්තිය මේ සඳහා යම් මඟ පෙන්වීමක් ලබාදෙන නමුත් එමගින් නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ ගැටලු සම්බන්දයෙන් විසඳුම් ලබාදීමක් සිදු නොවේ. පරිපූර්ණ ජාතික ප්‍රතිපත්තියක් නොමැති නිසා විවිධ ආයතන විසින් එකම කාර්යය, නැවත නැවතත් කිරීම සම්පත් අපතේ යාම සහ යාවත්කාලීන නොවූ පුහුණු වැඩසටහන් පවත්වා ගෙන යාම වැනි තත්ත්වයන්ට මඟ පාදනු ලබයි.

ශ්‍රී ලංකාවේ වැඩිහිටි අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම වගකීම දරන්නේ අධ්‍යාපන අමාත්‍යංශයයි. අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මඟින් වැඩිහිටි අධ්‍යාපනය සඳහා ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරනු ලබයි. කෙසේවෙතත් මෙම මධ්‍යස්ථාන වලින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවයේ හෝ ඒවා මගින් පුහුණු හෝ දැනුම කොතරම් දුරට උපකාර වූයේද යන්න ඇගයීමකට ලක් කිරීමට නොහැකිය.

ඕනෑම අංශයක ප්‍රගතිය සඳහා ඒ වෙනුවෙන් සිදුකරන මූල්‍ය සම්පාදනය ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාව දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා වෙන්කරනු ලබන මුදල් පසුගිය වසර කිහිපය තුළ ක්‍රමිකව අඩු වෙමින් පවතින අතර 2023 වසරේ (2023 එය ප්‍රතිශතයක් වශයෙන් 1.6% විය) සංඛ්‍යා ලේඛනවට අනුව නොවිධිමත් අධ්‍යාපනයට, එනම් වෘත්තීය අධ්‍යාපනයට සහ නොවිධිමත් අධ්‍යාපනය සඳහා වෙන්කර තිබෙන සමස්ත මුදලින් අධ්‍යාපන අමාත්‍යංශය වැය කර තිබෙන්නේ සමස්ත අයවැයෙන් 3% ප්‍රමාණයකි (මුදල් සහ ආර්ථික ස්තායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති පිළිබඳ අමාත්‍යාංශය) මේ අනුව මුදල් වෙන් කිරීමේ දුර්වලතාවයන් පමණක් නොව වෙන් කළ මුදල් ඵලදායී ආකාරයෙන් වියදම් කිරීම පිලිබඳවද ගැටලු පවතී. පිලිගත් ප්‍රතිපත්ති රාමුවක්, ක්‍රමෝපායයක් සහ සැලැස්මක් නොමැතිවීම මෙවැනි තත්ත්වයන්ට ප්‍රබල හේතුවක් වේ.




රාජ්‍ය නොවන අංශය මගින්ද වැඩිහිටි අධ්‍යාපන වැඩසටහන් පවත්වාගෙන යනු ලබයි. බොහෝ විට ව්‍යාපෘති ක්‍රියාකාරකම් පදනම් කරගෙන සිදුකරනු ලබන මෙම වැඩසටහන් හි දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ඒවා කෙටි කාලීන සහ අදාළ ව්‍යාපෘතියේ අවශ්‍යතාවය අනුව සැළසුම් කිරීමයි.

මෙම තත්ත්වයන් හමුවේ සමහර අවස්ථාවලදී ප්‍රදේශයේ සැබෑ අවශ්‍යතාවයන්ට හෝ පවත්නා ගැටලු විසඳීමට ඉවහල් නොවන මාතෘකාවන් හෝ ක්ෂේත්‍ර පිළිබඳව මෙම අධ්‍යාපන වැඩසටහන් ඉලක්ක වීම දක්නට ලැබේ. එසේම විවිධ ආයතතන මගින් සිදුකරනු ලබන වැඩසටහන් අතර යම් ආකාරයක සම්බන්ධීකරණයක් නොතිබීම සහ ව්‍යාපෘතියට ඉලක්ක ජනතාවට පමණක් මෙම වැඩසටහන් කේන්ද්‍රගත වීම මත ඒවායේ බලපෑම සීමා සහිත වී තිබේ.

### වැඩිහිටි අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමේදී අන්තර්ගත යුතු කරුණු

අධ්‍යාපනය සම්බන්ධ තීරණ ගැනීමේදී සහ නිශ්චිතව ක්‍රියාත්මක කිරීමේදී ඒ හා සම්බන්ධ නීතිමය රෙගුලාසි චක්‍රලේඛන පැවැතීම වැදගත් වේ. අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිවලට වැඩිහිටි

අධ්‍යාපනය සම්බන්ධයෙන් අදාළ කරුණු අන්තර්ගත කර තිබීම වැදගත් වේ.

මෑතකදී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමු දෙකක් එළිදැක්වනු ලැබූ අතර මේවායින් පළමුවැන්න ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිකුත් ප්‍රකාශයට පත් කරන ලදී. දීර්ඝ කාලීන උපදේශන ක්‍රියාවලියකින් පසුව සකස් කරන ලද මෙම යෝජනාවලියේ නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය වෙනුවෙන් ගනු ලබන තීරණ ක්‍රියාමාර්ග සඳහන් වේ. කෙසේවෙතත් මෙම ප්‍රතිපත්ති මාලාවෙහි වැඩිහිටි අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති යෝජනා ඇතුළත් නොවේ. මෙම යෝජනාවලිය 2023 වසරේදී ජනාධිපතිතුමාට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතික්ෂේප වූ අතර ඔහු විසින් නව අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමට කැබිනට් අනු කමිටුවක් පත්කරන ලදී. මෙම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුවේ (2023-2033) ප්‍රතිපත්ති මාලාවේ ප්‍රධාන අවධි තුනක් යටතේ අධ්‍යාපනය සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා සඳහන් කර ඇති නමුත් වැඩිහිටි හෝ අවිධිමත් අධ්‍යාපනය පිළිබඳව සඳහන් කර නොමැති බව පෙනී යයි.

**ජාතික සංවර්ධන ඉලක්ක සමඟ වැඩිහිටි අධ්‍යාපන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම**

ALE සඳහා වන ප්‍රතිපත්ති, දරිද්‍රතාවය අඩු කිරීම, ආර්ථික ව්‍යාප්තිය ප්‍රවර්ධනය කිරීම, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම සහ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම වැනි වඩාත් පොදු ජාතික සංවර්ධන ඉලක්ක සමඟ අනුකූල විය යුතුය. නිෂ්පාදනය, තාක්ෂණය සහ කෘෂිකර්මාන්තය වැනි කර්මාන්තවලට ALE වැඩසටහන් සම්බන්ධ කිරීමෙන් රාමුව ප්‍රජා නඟා සිටුවීමට සහ ශ්‍රම බලකායේ සංවර්ධනයට සහාය විය හැකිය. සමාජීය හා ආර්ථික දියුණුව සඳහා පදනමක් ලෙස ජීවිත කාලය පුරාම ඉගෙනීම අවධාරණය කරන ප්‍රතිපත්ති රැකියා, සාක්ෂරතාවය සහ කුසලතා සංවර්ධනය කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. තාක්ෂණික ඒකාබද්ධතාවය මගින් වැඩිහිටි අධ්‍යාපනයට පුළුල් ප්‍රේක්ෂක පිරිසකට ප්‍රවේශ විය හැකිය. පරිශීලක-හිතකාමී විද්‍යුත් ඉගෙනුම් වේදිකා, ජංගම යෙදුම් සහ සුහුරු පන්ති කාමර සංවර්ධනය කිරීම මගින් ස්ථානය නොසලකා ඉගෙන ගන්නන්ට සහභාගී විය හැකි බව සහතික කෙරේ. මෙම මෙවලම් වීඩියෝ දේශන, සාකච්ඡා සංසද සහ තත්‍ය කාලීන තක්සේරු කිරීම් ඇතුළු අන්තර් ක්‍රියාකාරී සහ සහයෝගී ඉගෙනුම් අත්දැකීම් සඳහා සහාය විය යුතුය. ^බෑ වැඩසටහන් සමඟ ඩිජිටල් සාක්ෂරතා මුලපිරීමක් දියත් කළ යුතුය. තාක්ෂණය මත පදනම් වූ ලෝකයක දියුණුවීමට ඉගෙන ගන්නන්ට මූලික සහ උසස් ඩිජිටල් කුසලතා අවශ්‍ය වන අතර, ඵලදායී මාර්ගගත සහ දෙමුහුන් ඉගෙනුම් ආකෘති ලබාදීම සඳහා ඩිජිටල් වේදිකා භාවිතා කිරීම පිළිබඳව අධ්‍යාපනඥයින් පුහුණු කළ යුතුය. මෙම ද්විත්ව අවධානය ඩිජිටල් බෙදීම පාලම් කරන අතර ^බෑ අවස්ථා සඳහා ඇතුළත් ප්‍රවේශය ප්‍රවර්ධනය කරනු ඇත.


ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා ගත යුතු පියවර සලකා බැලීමේදී වඩාත්ම වැදගත් වන්නේ මේ සඳහා සම්බන්ධ වන පිරිසගේ දැනුම කුසලතා නංවාලීමයි. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා ඉගෙනුම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් මෙම තත්ත්වය දැඩි ලෙස අවශ්‍ය වේ.

රාජ්‍ය නොවන සංවිධාන විසින් පුහුණු මධ්‍යස්ථාන ඇසුරෙන් ක්‍රියාත්මක කරනු ලබන නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන්වලදී වැඩි අවධානයක් යොමුකර තිබෙන්නේ වෘත්තීය පුහුණු අධ්‍යාපනය කෙරෙහි වේ. 2024 සැප්තැම්බර් මාසයේදී බලයට පත් වූ නව රජය සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රයේ සැලකිය යුතු ප්‍රතිසංස්කරණ සිදු කරන බව සඳහන් කර තිබේ. මෙම ප්‍රතිසංස්කරණ පිළිබඳ අවධානයක් යොමු වෙන සමයේ මෙම කරුණු පිළිබඳව බලධාරීන්ගේ අවධානය යොමු කරගැනීමට බලපෑම් කිරීම සහ උද්දේශනයේ යෙදීම සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට උත්සාහ දරන අප සැමගේ ප්‍රමුඛතම වගකීමක් වේ.

**Quotes of Education**

- "Education is the most powerful weapon which you can use to change the world."— Nelson Mandela
- "The roots of education are bitter, but the fruit is sweet."— Aristotle
- "An investment in knowledge pays the best interest."— Benjamin Franklin
- "Educating the mind without educating the heart is no education at all."— Aristotle
- "The only thing that interferes with my learning is my education."— Albert Einstein
- "Education is the most powerful weapon which you can use to change the world."— Nelson Mandela
- "The goal of education is the advancement of knowledge and the dissemination of truth."— John F. Kennedy
- "Education is not preparation for life; education is life itself."— John Dewey
- "The foundation of every state is the education of its youth."— Diogenes
- "An investment in knowledge pays the best interest."— Benjamin Franklin
- "Education is the key to unlock the golden door of freedom."— George Washington Carver
- "The only thing that interferes with my learning is my education."— Albert Einstein
- "Education is the movement from darkness to light."— Allan Bloom
- "When you educate one person, you can change the lives of many."— Shai Reshef
- "Education is a human right with immense power to transform. On its foundation rest the cornerstones of freedom, democracy, and sustainable human development."— Kofi Annan

# හඬට හඬක් - අධ්‍යාපනය වරප්‍රසාදයක් නොව අයිතියකි




වර්තමාන ආන්දෝලනාත්මක සංවාදයක් ව පවතින අධ්‍යාපනයේ වරප්‍රසාද භුක්ති විදීම තුළ විවිධ මතවාද, අදහස් සමාජය තුල ජනගත වෙමින් පවති. එකිනෙකාට පහරදෙමින් නිදහස් අධ්‍යාපනයේ සුජාතභාවය විනාශවෙමින් පවතින්නේ පොත නොබලා පිටකවරය පමණක් කියවන ජන සමාජයක් බව පෙන්වමින් එවැනි ජන සමාජයක් තුළ මෙම පණිවුඩය ජනගත කරමි.

අධ්‍යාපනය යනු කුමක් දැයි සොයා බැලීමට ප්‍රථමයෙන් අධ්‍යාපනය යන වචනය සෑදී ඇති ආකාරය පිළිබඳ අවධානය යොමු කර කළ යුතුය. Educo යන ලතින්  භාෂාවේ වචනයෙන් බිදී ආ වචනකි. එය පසුව ෑාමජ්එසදබ යනුවෙන් සකස් වී ඇත. Education යන වචනයේ අදහස සංස්කෘත ශබ්දකෝෂයේ ‘උපදෙස් දීම’ යනුවෙන් ද, ඉංග්‍රීසි ශබ්දකෝෂයේ ඉගැන්වීම යනුවෙන් ද දක්වයි.

අග්‍රවල් (Agrawal) විද්‍යාඥයාට අනුව අධ්‍යාපනය පිළිබඳව ප්‍රධාන කරුණු හතරක් යටතේ විග්‍රහ කරයි.

- Education - ඉගෙනීමේ ක්‍රියාවලිය.
- Educere  - මඟ පෙන්වීම හෝ එලියට ගැනීම.
- Educare - ඇති දැඩි කිරීම පුහුණු කිරීම, පුහුණු කිරීම.
- Educo - ඉදිරියට යොමු කිරීම සාරය එළියට ගැනීම.

අධ්‍යාපනය පිළිබඳ විවිධ දාර්ශනිකයන් විවිධ අදහස් පළකර ඇත. එම අදහස් අතර සමාජය තුළ සිදුවන ක්‍රියාවලියක් වශයෙන් මෙම අධ්‍යාපනය දෙස විද්‍යාත්මකව දෘෂ්ටිකෝණයෙන් ප්‍රථමයෙන්ම අවධානය යොමුකරන ලද දර්ශනිකයා වශයෙන් ඩුවී (Duwey) පෙන්වා දිය හැකිය. නමුත් එම අදහස පිළිබඳ විද්‍යාඥයන්ගේ දැඩි අවධානයට යොමු වූ බවක් දක්නට නැත. ඩුවීගෙන් පසු සමාජ විද්‍යාත්මක එළඹුමකින් අධ්‍යාපනය දෙස බලා එහි ඇති වැදගත්කම ප්‍රකාශ කළ දාර්ශනිකයා වශයෙන් එමිල් ඩුර්කයිම් (Emile Durkheim) හා මැක්ස් වෙබර් (Max Weber) පෙන්වාදිය හැකිය. මෙම දෙදෙනා අතරින් අධ්‍යාපනය පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇත්තේ එමිල් ඩුර්කයිම් විසිනි. මුල්කාලීනව අධ්‍යාපනය දෙස දාර්ශනික දෘෂ්ටිකෝණයෙන් බලා ඒ පිළිබඳ ඉදිරිපත් කර ඇති දාර්ශනික මත පහත අයුරින් පෙන්වා දිය හැකිය.

“අධ්‍යාපනය නිශ්චල දෙක් නොව, අවශ්‍යතා හා කාලානුරූපව නිරතුරුවම වෙනස්වමින් පවතින ක්‍රියාවලියක් බවයි” (Emile Kurkheim 1857-1917)

සෑම පුද්ගලයෙකුටම ඔබින පරමාර්ථ අධ්‍යාපන ක්‍රමයක් නොමැති බවත්, සෑම සමාජයක් තුළම  අධ්‍යාපන පද්ධතිය බොහෝ දුරට තීරණය වන්නේ, ඒ ඒ සමාජවල ඇති සමාජ-සංස්කෘතික විවිධතා හා අවශ්‍යතා අනුව බවත් ඔහුගේ විශ්වාසයයි, මේ පිළිබඳව තවදුරටත් අදහස් දක්වන ඔහු සඳහන් කර ඉහත අයුරින් පෙන්වා දිය හැක.

“අධ්‍යාපනය සමාජ විද්‍යා ශික්ෂාව (Discipline) සැලසුම් වී ඇත්තේ අනාගත ක්‍රියාවන් සඳහා අධ්‍යාපනඥයන් සූදානම් කිරීමට බවයි.˜ (Zanieki 1882-1958)

මෙම ලේඛකයාට අනුව, සමාජ විද්‍යා පර්යේෂණ මගින් ලබාග න්නා දැනුම, අධ්‍යාපන ක්‍රියාදාමය සැලසුම් කිරීම හා එම සැලසුම් ඵලදායි ලෙස ක්‍රියාවට නැංවීම සඳහා යොදාගත ගත හැකි ය. ඒ හේතුව නිසාම එය ව්‍යවහාරික විද්‍යාවක් බවට පත්වෙන බව ෂැනන්කගේ නිගමනයයි. මෙයින් පැහැදිලි වන්නේ අධ්‍යාපන සමාජ විද්‍යඥයාගේ මූලික අරමුණ අධ්‍යාපනය කුමක්ද යන්න අධ්‍යාපනඥයින්ට අවබෝධ කරීමත් සමාජයේ අවශ්‍යතා පිරිමැසෙන පරිදි එය සංවිධානය වී ඇති ආකාරය හැදෑරීමත් බව පෙන්වා දෙයි.

“පුද්ගලයෙකු ලබාගත්, ලබාගන්නා වූ අත්දැකීම් හා සංවිධානය කර ගන්නා සමාජ සම්බන්ධතා පිළිබඳව විස්තර කරන විද්‍යාව අධ්‍යාපන සමාජ විද්‍යාව බවයි” (fmaks þye 1928)

"ආර්ථික හා සංස්කෘතික ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරමින් අන්තිමේදී පන්ති භේද, ප්‍රතිනිෂ්පාදනය ගොඩනැගීමේ මූලික සාධනය අධ්‍යාපනයයි." (මාක්ස්වාදී අධ්‍යාපනයෙහි මුල් කාලීන අදහසක්)

සමාජ ස්ථර ක්‍රමය තවදුරටත් තහවුරු කොට පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපනය භාවිතා කරන බව අධ්‍යාපන සමාජ විද්‍යාව තුළ පැහැදිලි වන බව ඔවුන්ගේ අදහස විය. අධ්‍යාපන විද්‍යාවේ සංවර්ධිත යුගය ආරම්භ වන්නේ 1960 කාල වකවානුවෙන් පසුවය. මෙම කාල වකවානුවෙන් පසුව අධ්‍යාපනය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන කීපයක් පහත අයුරින් පෙන්වාදිය හැකිය.

"ජීවිතයේ ප්‍රීතිය හා වාසනාව සලසා දෙන පරිදි බුද්ධිය වර්ධනය ඇති කිරීම හා ජීවන තත්වය නගාලීම අධ්‍යාපනයයි"(ෆ්‍රැන්සිසි බේකන්)

"අධ්‍යාපනයේ උත්තරීතර අගය නම් ගුණ දහමින් යුත් හදවතක් ඇති පුද්ගලයෙකු තැනීමයි"(කොන්පියුසස්තුමා)

"අධ්‍යාපනය මගින් සාවද්‍ය දේවල් ඉවත් කරමින් සත්‍ය අනාවරණය කොට ගත යුතුය"(සොක්‍රටීස්)

පුද්ගලයාට නිසියාකාරව යමක් පිළිබඳව අවබෝධය ලබා ගැනීමට හැකියාව ලැබෙන පරිදි අත්දැකීම් තුළින් ඔහු සංවර්ධනය වීම, එසේ කිරීමටනම් පුද්ගලයා සත්‍ය අනාවරණය කරගෙන සිටිය යුතුයි බව ඔහු වැඩි දුරටත් පෙන්වා දෙයි.

"බාල කාලයේ ස්වභාව ධර්මය අනුව වැඩෙන දරුවාට හොඳ පුරුදු හා පුහුණුවක් දීමෙන් සංවර්ධනය කිරීම අධ්‍යාපනයයි" (ආමෝස් කොමේනියස්)

"අධ්‍යාපනය පුද්ගලයාගේ හිස, හදවත සහ අත සංවර්ධනය කීමය" (මහත්මා ගාන්ධි)

"අධ්‍යාපනයේ ප්‍රමුඛ නිෂ්ටාව වන්නේ අලුත් අලුත් දේ කළ හැකි නිර්මාණශීලි නවොත්පාදක හා ගවේෂණශීලි පුද්ගලයන් බිහි කිරීමයි" (ජීන් පියාජේ)

මහත්මා ගාන්ධි සහ ජීන් පියාජේගේ නිර්වචනවලින් පැහැදිලි කිරීම් සඳහා පහත වගුව මනාවට උපයෝගී වේ.

| මහත්මා ගාන්ධි | | බෙන්ජමින් එස් බ්ලුම්හිස |
|---|---|---|
| හිස | දැනුම (Knowladge) | ප්‍රජානන (Cognitive) |
| හදවත | ආකල්ප (Attitude) | ආවේදන (Affective) |
| අත | කුසලතා (Skills) | මනෝචාලක (Phychomotive) |

ඉහත දැක්වූ අධ්‍යාපන සංකල්ප පිළිබඳ විවිධ සංදර්භාදිය ඉදිරිපත් කර ඇති නිර්වචන රාශියක් ඇත.

"දැනුම හා අවබෝධ නොහොත් අවබෝධයට පාදක වූ ආත්මීකරණය නිරීම අධ්‍යාපනයයි" (හර්ටිස්)

පෙරදිග චින්තනයයට අනුව "අධ්‍යාපන පරමාර්ථ වන්නේ විනය හෙවත් හික්මීමයි."ඒ බව පහත නිර්වචනයෙන් පෙනීයයි. පෙරදිග චින්තනයට අනුව "අධ්‍යාපන පරමාර්ථය වන්නේ විනය හෙවත් හික්මීමයි. පුද්ගලයා උපතේ සිට මරණය දක්වා ආධ්‍යාත්මික වශයෙන් ද, චර්යාමය වශයෙන් ද, ප්‍රායෝගික ක්‍රියාකාරකම් වශයෙන් දපුද්ගලයෙකු ලබන පුහුණුව හා හික්මීම අධ්‍යාපනය යන්නේ අර්ථවත් වේ."

"අධ්‍යාපන ක්‍රියාවලියේ අවසානයක් නැත. මාධ්‍යක් නැත. යන දෙකම එකක් වේ. අධ්‍යාපනය දිගටම වැඩෙන්නකි."(law lance Elikadeth)

බෞද්ධ දර්ශනයට අනුව අධ්‍යාපනය යන්න පිළිබඳව මෙසේ අදහස් පෙන්වා දිය හැකිය. "අධ්‍යාපනය භාවයෙන් භවයට යන අත්දැකීම් මාලාවකි."ඒ අනුව අධ්‍යාපනය යනු පුද්ගලයෙකු යථා තත්වයට පත්කිරි මේ ක්‍රියාවලියක් බව මෙයින් අදහස් කරයි.

ඉහතින් සඳහන් සමස්ථ නිර්වචන සියල්ලටම පොදු නිර්වචනයක් උපාලි සේදර විසින් ඉදිරිපත් කර ඇත. "අධ්‍යාපනය යනු අපේක්ෂිත දිශාවක් කෙරෙහි ශිෂ්‍ය චර්යාවන් හෙවත් හැසිරීම් වෙනස් කිරීමේ ක්‍රියා පද්ධතියකි."

මෙලෙස පුද්ගලයා අධ්‍යාපනය ලබාගන්නා ආකාරය 03ක් අධ්‍යාපන විද්‍යාව තුළ දැකිය හැකිය.

- විධිමත් අධ්‍යාපනය
- අවිධිමත් අධ්‍යාපනය
- නොවිධිමත් අධ්‍යාපනය

ඉහත සඳහන් අධ්‍යාපන ක්‍රම 03ට අමතරව නව සංකල්පයක් ඉදිරිපත් වී ඇත. එනමුත් ඒ නිවැරදි අර්ථයක් සිංහල භාෂාවෙන් ඉදිරිපත් කර නැත. self-taught autodidactic තමාට තමාම උගන්වා ගැනීම දල අදහසකි. මෙකී සියළු නිර්වචනයන් පොදුවේ ගෙන සලකා බලන විට අධ්‍යාපනය යන්න දිය හාකි වඩාත්ම ගැලපෙන පොදු නිර්වචනය මෙසේ ඉදිරිපත් කර හැකිය. "පුද්ගලයෙකු උපතේ සිට මරණය දක්වා බාහිර අභ්‍යන්තර චර්යාවන් හැඩ ගැස්වීම කෙරෙහි ලබා ගන්නා අද්දැකීම් හා ලැබෙන්නා වූ අත්දැකීම් ලබාගන්නා වූ ක්‍රියාවලිය අධ්‍යාපනයයි." මෙහිදි ප්‍රජානන ආවේචන මනෝචාලක (හිස හදවත අත) යන කෙත්ත් තුනම සංවර්ධනය වීම අපේක්ෂා කෙරේ" යනුවෙන් පෙන්වාදිය හැකිය.

**වජිර උමගිලිය මහතා.**
**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික (ඌව පළාත)**

# Finance-Budget and Budget monitoring



## 1. Guide Lines for the Preparation of Budgets

**The role of budgeting**

Budgeting has a vital role to play throughout the life cycle of every project. Money is the lifeblood of any project (or NGO), and it is controlled through budgets. So, budgeting is a fundamental element of all planning and monitoring.

In the planning stages, it is necessary for the project's managers to have an accurate idea of the true cost of the project. This should have an impact on the design of the project.

Without a realistic estimate of costs, there is no way of comparing the output of the project to the resources required. This would prevent senior management from making strategic decisions about how best to use their limited resources. (For example, the cost of over-budgeting one project is paid in terms of lack of funding available for other projects. In other words, if project budgets are made too big, then they reduce the total results that an NGO can achieve.) The budget is also the basis of all financial negotiations with donors, for external funding.

An accurate budget is also needed as a financial control once the project is under way. The basis of financial management is comparing actual costs to budgeted costs. Without an accurate budget, this is impossible. Finally, the budget should form part of the evaluation of a project once it is finished.

**Definition and overall approach to budgeting**

A budget described the expected costs of one set of activities. So, budgets often have to be revised part way through a project. This happens when the activities that are actually carried out change from the activities originally planned. For example,There is no point in comparing the actual cost of buying apples to the projected cost of buying oranges . This means that it is important that the original budget was put together in a logical, simple way. Otherwise, it is impossible to understand how the original figures were calculated . And this makes it impossible to adapt the budget to changing circumstances.

What all of this means is that it is extremely important for budgets to be carefully thought through and well presented. Somebody else picking up your budget should always be able to understand it all (and adapt it, when necessary) with no additional explanation beyond what is written down. These notes suggest one way of doing this.

**Note about accounts structure**

A budget is drawn up using a specific accounts structure. An 'accounts structure' is the way in which costs are categorised. (For example, costs may be categorised as: local staff, international staff, travel, etc.) It is generally difficult to move from one accounts structure to another, once a project is under way.

The choice of accounts structure may be set by the NGO that you are working for – and if so, it must be used. However, some external donors have strict accounts structures that must also be accommodated. If you are receiving external funding for your project, then this must be looked into, as early as possible. You can save a lot of pain later on, by setting up an appropriate accounts structure

A budget is drawn up using a specific accounts structure. An 'accounts structure' is the way in which costs are categorised. (For example, costs may be categorised as: local staff, international staff, travel, etc.) It is generally difficult to move from one accounts structure to another, once a project is under way.

The choice of accounts structure may be set by the NGO that you are working for – and if so, it must be used. However,

some external donors have strict accounts structures that must also be accommodated. If you are receiving external funding for your project, then this must be looked into, as early as possible. You can save a lot of pain later on, by setting up an appropriate accounts structure

**An approach to drawing up a budget**

Suggested layout:

**Budget Details**

Project:S*chools development project*

Period: 1ST MARCH 2000 – 28TH FEBRUARY 2001

CURRENCY:LKR

**Code Description Unit Quantity Unit cost Total cost Notes**

e.g.:A1 Project manager Person-month 12 1,500 18,000 Grade 4, for one year.

**Budget details -** All budgets must include basic information about the project, including the name, the period covered in the project, and the currency used. If the NGO has allocated a specific code to the project, then this should be listed here as well. If more than one currency is used , then each column of the budget, which contains costs, must be clearly labelled with the currency used.

**Code -** The accounts code for each item should be written in the 'code' column. The codes will be made up according to the accounts structure, as mentioned above. This suggested layout for drawing up a budget can be used with any accounts structure. (The structure will just affect the order in which you write down the different costs.)

**Description -** A short description for each type of cost should be written in the 'description' column. This should be as detailed as possible, and should be unique for each item. For example, for staff, it is often much clearer to write out 'Project Officer 1', 'Project Officer 2' and 'Project Officer 3' on different lines, rather than just to have one line 'Project Officers'. A good rule of thumb is to go for more detail rather than less, if you are not sure how to describe a cost.

It is also important that descriptions are as precise as possible. For example, 'electricity for the office' is much more useful than 'power'.

It is often useful to put 'other' lines at the bottom of each section of the budget. This ensures that there are accounts codes for unforeseen expenditure. This means that the accounts codes do not have to be stretched when unexpected things happen – which they surely will. (Budgets are not meant to describe all project costs inflexibly: they should be a much more useful management tool than that. So, they have to be realistic, and accept that it may not be possible to pin every cost down precisely in advance.)

**Unit -** The unit which you will use to budget for each item should be written in the 'unit' column. The choice of units is often not as straightforward as it seems. But, choosing the right units makes a big difference to the clarity and strength of a budget.

For example, some budgets try to measure all costs in terms of time (e.g. the monthly cost). This is useful for some items (like salaries, which are paid every month) but not for others (like computers, which are only bought once). The rule of thumb is that you should choose units, which correspond to how you will actually make payments for each item. This means that there will be different units for different items. You should not try to set units (e.g. the monthly cost) for the whole budget: this will only cause confusion for some items.

Examples of common units used are:

For long-term staff:

- Person
- Person-year
- Person-month

For short-term staff:

- Person-day

For daily allowances, subsistence and accommodation costs:

- Person-day
- Person-night

For Refreshment costs for participating workshop

- Per participant per event per day

For venue rental costs

- per day per event

For computer-Hardware/software

- Per unit set (e.g. Laptop, computer software and printer)

For office furniture and fixtures

- Per unit set

IIt is always useful to include the time scale as well as the service that you will use in the unit. This means that you often end up using 'composite units' – e.g. a 'person-day'. For example, this would be the best unit to use for a consultant who will be working for ten days on a project. 'Person' on its own does not show for how long you want the consultant. 'Day' on its own does not show what you want to buy for each day. 'Person-day' includes both parts of this. You will pay the consultant for each day's work that he/she does. So, to budget for '10 person-days' is much more clear than budgeting for '1 consultant' or for '10 days'.

By being specific about the time period for each line on a budget, you are not tied to one unit of time for the whole budget. This is useful: for example, it is sensible to budget for long term staff in months, and for labourers in days.

**Quantity -** The total quantity (measured in the units given) should be written in the 'quantity' column. It is important to make sure that the quantity does match the units.

**Unit Cost -** The cost of one unit (of the units given) should be written in the 'unit cost' column. All costs that are written in the same column must be given in the same currency. If you need to show the budget in a second currency, then put on a whole new column for that currency, label it clearly and give the exchange rate used.

**Total Cost -** TThe total cost column should be filled in with the 'unit cost' multiplied by the 'quantity'. It is extremely important that all lines really do have this calculation made on them. If the numbers do not add up, then it is very hard to have any faith in the budget, or to adjust the budget.

(For example, suppose a budget showed 5 bags of cement each with a unit cost of Rs450, having a total cost of Rs1,800/=. It is impossible to tell if this means that each bag could actually be bought for Rs360/=, or if only 4 bags were bought for Rs450 each. So, it is impossible to adjust the budget to changing circumstances. The total cost must be 5 x Rs450 = Rs2,250/=)

**Notes -** Any notes about how a figure (either the cost or quantity) should be written in the 'notes' column. This column is often not included in budgets. It always should be. Without it, it is impossible to know exactly why the quantity (or the unit cost) shown on the budget has been chosen. Every line should have a 'note' written alongside it. For example, if 5 air flights have been budgeted for, the note should explain why there are 5 flights, and not 4 or 6. Without a good record of the decisions taken in drawing up the budget, it is impossible to adjust the budget. This severely limits the use of the budget and the quality of financial management possible.

It is always useful to write more rather than less in the notes column. However, these notes do not have to be huge. They just have to be enough to explain the numbers given in the other columns of the budget. It cannot be stressed enough how important this information is.

## 2. Budget monitoring and variance Analysis

**The Financial management process ,just like the project management cycle, involves paying close attention to**

**Project objectives**.


- Plan: When we set up a new project, we establish clear objectives and activity plans. We then prepare budgets & forecasts based on activity plans.

- Do: Once we have secured the necessary funding, we implement the activity plan to achieve the objectives set out in the planning stage. This involves spending money and keeping an account of all transactions.

- Review: On a regular basis, project managers will review what has been achieved compared with the original plans. In financial terms, this means comparing the budget with what we have actually spent (and received) to see if the project is on target to achieve its objectives. Budget Vs Actual exp provide us with budget monitoring information**.**

The results of this review will help managers decide if they need to take corrective action. The learning from the review stage is taken forward to the next planning phase, and so on, in a continuous cycle**.**

## 3. The Role and Uses of the Monitoring sheet




**4. Good r*eason for using Budget Vs Actual expenses finance report used as tool***

***for budget monitoring***

- Closely look at how budgets are being used to achieve the projects objectives as planned.
- To know How much of funds spent on different activities and how much have left to spend before the end of the project.
- To explain to donors how used their funds in different activities why the results might be different to what we expected at the start of the project
- In case of Over spend on some budget items indicating the warning signal of non availability of enough money for other budget line items.
- In case of under spend on some budget items indicating the signal of no possible cause of achieving the objectives
- The Figure might give us an early warning of misuse of funds.
- It is good to know how much of money need for our projects in the next few months so that we can better manage project and organisational cash flow to make sure we have enough fund available in the bank when need it four activities.
- Financial information helps us to make decisions about the future—such as how to allocate scarce resources to different activities.
- We can often detect errors and omissions in the accounting records from financial report because sometimes the figures just do not look right.

**S. Prabagar**
**Finance Coordinator**

# CED නායකත්වයෙන් අධ්‍යාපන අයිතිවාසිකම් සුරැකීම වෙනුවෙන් එක් පියවරක්

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ අයිතිය (RTI) ප්‍රායෝගික මෙවලමක් වශයෙන් භාවිතා කිරීම පිළිබඳව සමාජය තුළ අවබෝධයක් ඇති කිරීමට අරමුණු කරගෙන, අධ්‍යාපන සංවර්ධන සංවිධානය කළ සාර්ථක වැඩසටහනක් පසුගිය 2024 අගෝස්තු මස 10 වන දින කොළඹ සැප්ශ්‍රී ආයතනයේදී පැවැත්විණි. අධ්‍යාපන සංවර්ධන සංවිධානයේ සාමාජිකත්වය දරන දිවයින පුරා පිහිටි සාමාජික සංවිධානයන් නියෝජනය කරමින් කාන්තාවන් 50 කට ආසන්න පිරිසක් මේ සඳහා සහභාගි වී සිටියහ. මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය තොරතුරු දැනගැනීමේ කොමිසමේ කොමසාරිස් නීතිඥ ජගත් ලියනආරච්චි මහතා විසින් සපයන ලදී .

මෙම අවස්ථාවේදී, තොරතුරු දැනගැනීමේ පනත භාවිතා කරමින් අධ්‍යාපන අවස්ථා ආරක්ෂා කිරීම, ගුණාත්මක අධ්‍යාපනයක් ඇති කිරීම හා උසස් කිරීම වෙනුවෙන් අවධානය යොමු කරන ලදී. එසේම සාකච්ඡා සහ ප්‍රායෝගික උදාහරණ ඔස්සේ, ගැටලුවලට විසඳුම් සොයා ගැනීම සහ ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා පෙනී සිටීම සඳහා අවශ්‍ය දැනුම හා සම්පත් ලබා දීම මූලික අරමුණ විය. මෙම වැඩසටහන අධ්‍යාපන අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කිරීම වෙනුවෙන් දරණ ලද තවත් එක් ප්‍රයත්නයක් වූ අතර දරිද්‍රතාවය හා අසාධාරණය තුරන් කිරීමේ වැදගත්කම මතු කරමින්, මනාව නිවැරදි සමාජයක් ගොඩනැගීමට අධ්‍යාපන සංවර්ධන සංවිධානයේ කැපවීම  නැවත තහවුරු කළේය.









## මීළඟ කලාපයෙන්, ඔබේ හඬට, අපෙන්  පිටුවක්....



ඔබ ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රවීනයෙක් වන ඔබට,
අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ලිපි, පද්‍ය, ජයග්‍රහණ මෙන්ම ඔබ ජීවත් වන ප්‍රදේශයේ සුවිශේෂ අවස්තාවන් අපට කියන්න. මීලග හඩ සඟරාව සඳහා ඔබේ නිර්මාණ 2024 සැප්තැම්බර් 20 ට පෙර lakmalicedsrilanka@gmail.com මෙම ලිපිනයට එවන්න.

සිංහල ලිපි : Font – FMAbhaya, Size 12

ඉංග්‍රීසි ලිපි : Font – Times New Roman, Size 12

# අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ අනුග්‍රහයෙන් දීපව්‍යාප්තව පවත්වන ලද ලෝක ළමා දින වැඩසටහන්

දරුවන් අපේ ආදරණීය අනාගතයයි. ඔවුන්ගේ සිහින, අභිලාෂ, සහ සිතුවිලි අපගේ සමාජය මනාව වෙනස් කිරීම වෙනුවෙන් අවශ්‍ය අඩිතාලම සපයයි. ළමා දිනය යනු, දරුවන්ගේ අයිතිවාසිකම් පිළිබඳව අවධාරණය කිරීම සහ ඔවුන්ගේ ගුණාත්මක අධ්‍යාපනය, ආරක්ෂාව, සහ සතුට සුරක්ෂිත කිරීමට අපේ වගකීම සිහිකැඳවන්නකි. එසේම අපේ දරුවන්ට ප්‍රේමයෙන් පිරුණු අනාගතයක් ගොඩනැගීමට කටයුතු කළ යුතු බව අප සැමටම මතක් කරන දිනයකි. දරුවන්ගේ සිහින සැබෑ කරගැනීම සඳහා අවස්ථාවන් සැදීමේ වැදගත්කම මනාව වටහා ගන්නා අවස්ථාවක් වශයෙන් ද ලොව පුරා මේ දිනය සැමරේ.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය විසින් මෙවර ලෝක ළමා දින වැඩසටහන් දීපව්‍යාප්තව පවත්වන ලදී. ඒ අනුව අධ්‍යාපන සංවර්ධන සන්ධානය සතු සාමාජික සංවිධාන එක්ව මෙම වැඩසටහන් ක්‍රියාත්මක වූ අතර එය දිස්ත්‍රික් 18ක අතිසාර්ථක අන්දමින් පවත්වන ලදී. මෙය EOL ව්‍යාපෘතියේ එක වැඩසටහනක් වූ අතර ඒ සඳහා අරමුදල් සපයන්නේ අධ්‍යාපනය සඳහා වූ ගෝලීය පාර් ශවකරණ ආයතනය විසිනි.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය 2024 ඔක්තෝම්බර් 01 වන දිනට යෙදෙන ජාත්‍යන්තර ලෝක ළමා දිනය වෙනුවෙන් ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පදනම් කර ගනිමින් වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී ළමයින්ගේ අධ්‍යාපන අයිතීන් සුරක්ෂිත කිරීම සඳහා වූ ප්‍රතිපත්තීන් නොපිරිහෙලා ක්‍රියාවට නැංවීමට බලධාරීන්ගේ අවධානය යොමු කරවීම  සහ ළමුන් වෙනුවෙන් වූ සමාජයීය වගකීම අවධාරණය කිරීම සඳහා මෙහිදී ප්‍රධාන අරමුණ කරගන්නා ලදී. ඒ අනුව,

- ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්
- ළමා මනෝ උපදේශනය පිළිබඳ වූ වැඩසටහන්
- ළමා අයිතිවාසිකම් තේමාව කරගත් නාට්‍ය, පෝස්ටර් හා චිත්‍ර ප්‍රදර්ශනය

යනාදිය පවත්වන ලදී. මෙම වැඩසටහන් 2024 ඔක්තෝම්බර් 01 සිට 10 වනදා දක්වා දිස්ත්‍රික් මට්ටමින් වශයෙන් ක්‍රියාත්මක වූ අතර එහි අධීක්ෂණ කටයුතු සිදු කරන ලද්දේ අධ්‍යාපන සංවර්ධන සන්ධානයේ සභාපතිතුමා, ලේකම්තුමා හා භාණ්ඩාගාරිකතුමා විසිනි. මේ සම්බන්ධයෙන් සක්‍රියව දායකත්වය ලබා දුන් අප සංවිධානයේ සියලුම පළාත්, දිස්ත්‍රික්ක, සාමාජික සංවිධාන සාමාජිකයන්ට හා සහභාගි වූ සියලුම දෙනාට අපගේ විශේෂ ස්තුතිය පුද කර සිටිමු.


ලෝක ළමා දින වැඩසටහන - කෑගල්ල දිස්ත්‍රික්කය



ලෝක ළමා දින වැඩසටහන - අම්පාර දිස්ත්‍රික්කය


ලෝක ළමා දින වැඩසටහන - මාතර දිස්ත්‍රික්කය

## HAPPY INTERNATIONAL DAY OF EDUCATION 2025!



සෑම වසරකම අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර දිනය යෙදෙන්නේ ජනවාරි 24 දිනයට යි. 2025 වසරේ මෙවර තේමාව වූයේ,

“AI and Education : Preserving Human Agency in a World of Automation”

“ AI සහ අධ්‍යාපනයඃ නව තාක්ෂණික ලෝකයක මානව ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම.”යන්නයි.

අධ්‍යාපන සංවර්ධන සන්ධානය
නො. 17, ධර්මපාල පෙදෙස, රාජගිරිය
Web: cedsrilanka.org
දුරකතනය : 0112887642